## කවි කොළය

# මට මහලු වයසේ...!



ඉඳිකටු අනිනු මෙනි විටකදි යටි පල්ලේ
දැඩි වේදනාවකි පය මහපටැ ඟිල්ලේ
රැලි මැද නහරවැල් මතුවී ඇත බෙල්ලේ
පැල ඉනි වැටක් වාගෙයි දත් ටික සෙල්ලේ

කියවනු නොහැක කණ්ණාඩිය නැතිව පොත
මීදුම් දැලක් බැන්දා මෙනි පෙනුම නෙත
වෙව්ලයි දෙපා පෙර පැවතුණු ජවය නැත
යන එන උදව්වට දැන් හැරමිටිය ඇත

සිතිවිලි නැගෙන මුත් ඉඳහිට මන මාල
ඒවා මදනමෝදක මෙනි සැර බාල
බිරිඳද මට වඩා විසි වසකින් බාල
දරුවන්ගෙන් අසයි "කෝ බං මහ රාළ?"

තෙත්බව දැනෙයි නොදැනිම හැඳ සිටි පිළියේ
කැඩුවා වගේ වක්කඩ යයි බඩ එළියේ
හිරවුණ දාට ඉඳ හිට දොර කුරු බිලියේ
සිදුවෙයි පැය දෙකක් ඉන්නට වැසි කිළියේ

අංකල් කියා අමතන මුත් සියළු දෙන
පවසයි නාකියා යයි මා නොමැති තැන
සුදු ඇඳ මහෝපාසක වී පෙහොය දින
බොරු සිල් රකින්නෙමි බණපොත අතට ගෙන

අබිලික් වෙලා ඇත මුහුණෙහි තිබුණු හැඩේ
වාතය පිරී වද දෙයි හැම විටම බඩේ
වයසට යාම නම් වූ මේ කරුම ලෙඩේ
මුහුණේ රැවුළ මෙන් දවසින් දවස වැඩේ

ඉදිමුණ නිසා හටගත් ගලකට සිරී
කැපුවා කකුල එය ඔඩුගිය බව තේරී
ඉන්නට ඉඩක් නැත දොස්තරගෙන් බේරී
මේ මළකඳෙත් බොන්නට සැරසෙයි රීරී

ලේ වල සීනි ඇත උක් දණ්ඩක වාගේ
නොබසී පහළ හද පීඩනයෙහි වේගේ
බෙහෙතක් නොමැත මේ වයසට යන රෝගේ
සතුටේ මාරයා වී ඇත මිනි සාගේ

නිදියනු නොහැක
අතපය හිරි වැට්ටේ ය
හඳ පායා තිබේ
හිස මැද තට්ටේ ය
වස්තුව එකම දැන්
පැදුරයි කොට්ටේ ය
මා දැන් සිටින්නේ
මිනිවළ ගැට්ටේ ය



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

## රිසානාගේ මරණ දඬුවම සවුදිය අත්හිටවයි!

සවුදි අරාබියාවේ උසාවිය මගින් මරණ දඬුවම තීන්දු කරනු ලැබ එහි සිරගෙදර සිටිනා රිසානා නෆීක් නම් ශ්‍රීලාංකික තරුණියගේ මරණ දඬුවම ශ්‍රීලංකා ජනාධිපතිවරාගේ ඉල්ලීම මත සවුදියේ රජතුමා විසින් අත් හිටවා ඇති බව ගිය සතියේ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ දී විදේශ රැකියා සහ සුබ සාධන ඇමති ඩිලාන් පෙරේරා මහතා ප්‍රකාශ කළේ ය.

2007 ජූනි 16 වන දින සවුදියේ සිව්මස් වියැති බිළිඳෙකුගේ මරණය සිදු කළායයි ඇය චෝදනා ලබා මරණ දඬුවමට කැපවී සිටි යාය. රිසානා දිගටම කියා සිටි යේ තමා නිදොස් බවයි

## ලන්ඩනයේ මාලිනීට උපහාර



ජාත්‍යන්තර සම්මානයට පත් අසහාය ශ්‍රීලංකා සිනමා කලාකාරිය වන **ආචාර්ය මාලිනී ෆොන්සේකා මහත්මියට** උපහාර දැක්වීමේ උළෙලක් **ලන්ඩනයේ දී** පැවැත්වේ. එදින ඇය ප්‍රධාන චරිතය රඟපාන සම්මාන දිනූ **ආකාස කුසුම්** සිනමා කෘතිය ද තිරගත කෙරේ.

**ස්ථානය** - **RNB Banqueting Venue**
366A, Stag Lane
Kingsbury, London NW9 9AA
**දිනය** - **31 December 2010**
**වෙලාව** - **1 pm - 6 pm**
**ප්‍රවේශපත්‍ර** - For film - £20 (Adults)
Child - £10 (age 5-12)
**කථක** - **ජැක්සන් ඇන්තනි**
**සංගීතය** - **ගායනා** - **කීර්ති පැස්කුවල්**
**Contact** - **Anthony - 079 5656 9786**
**Jayantha- 0208 905 9154**
**Dudley - 079 0458 2779**

## සුසන්තිකා යළි ධාවනයේ



සුසන්තිකා ජයසිංහ

විශ්‍රාමගෙන ක්‍රීඩා ලෝකයෙන් ඉවත් වූ ඔලිම්පික් සම්මානලාභී ශ්‍රීලංකා ධාවන රැජිණ, 35 වියැති සුසන්තිකා ජයසිංහ යළිත් ධාවන යට පිවිසෙන බව නොබෝදා කියා ඇත. 2009 පෙබරවාරි මස දරු ප්‍රසූතිය සඳහා ක්‍රීඩාවෙන් සමුගත් ඇය පවසන්නේ වයස ක්‍රීඩාවට බාධකයක් නොවන බවයි. ඉතා ඉක්මනින් යළි පුහුණු වීමේ කටයුතු අරඹන්නට ඇය සිතා සිටියි.

"ඇමරිකාවෙ මර්ලින් ඕටේ වයස 46 දී තවමත් දුවනව නම්, දිනනවා නම්, මට මොකද බැරි? ටිකක් පුහුණුවුනොත් මට ලේසි යෙන් මීටර් 100 ජයගත හැකියි. බලන්න දැන් අපේ රටේ මලල ක්‍රීඩා තත්වෙ. අන්තිමයි..... ඒකයි මම ආයිත් එන්න හිතුවෙ...." ඇය කියයි

සුසන්තිකා පසුගිය මැතිවරණ යේ දී ආසනයක් ද තරඟ කළාය.



**ඉරිදා- SUN** ලබන ජනවාරි පළවෙනිදා කොළඹ හෝටලේක ඩාන්ස් එකක රන්ජිත් ගිටාර් ගහන්න යන කතාව ගිය මාසෙ අපේ ගෙදර ආපු වෙලාවෙ කිව්වා. ඒක අහලා අපේ එක්කෙනත් කොහෙන්ද කාර් බූට් සේල් එකකින් පවුම් පහකට කම්බිත් කැඩිච්ච ගිටාර් කට්ටක් ගෙනැල්ලා කාමරේ දොර වහගෙන ප්‍රැක්ටිස් කරනවා ඇහෙනවා. මම හිනා වුනාම තද වුණා. එයා කියන්නෙ හරියට සංගීතෙ දැනගන්න ඕන නැත. ඩාන්ස් එකකට ගිහිං බීලා ඉන්න වෙලාවට මොනව ගැහුවත් අපේ අයට තේරුමක් නැහැ, ඔහේ නටනව කියලා.

**සඳුදා- MON** ගිය සති දෙකේම හැමතැනම කතාව අපේ ජනාධිපතිතුමාට ඔක්ස්පර්ඩ් යුනිවර්සිටි එකේ කතාකරන්න ඉඩ දීපු නැති එක ගැන. කැතරින් පුංචිඅම්ම තකහනියක් කඩවත ඉඳලා ටෙලිපෝන් කළා. පුංචි අම්මා කිව්වෙ මේ විදියට. "දුවේ කවුරු මොනව කිව්වත්, මම නම් කියන්නෙ මහින්ද මහත්තෙයා ආපු එක හොඳයි කියලා. නැත්නම් ඔවුන් හිතන්නෙම බයේ ආවෙ නෑ කියල නේ. දැන් කීයටවත් උන්ට ඒ කතාව කියන්න බෑ. ආවොත් අල්ලනවා, අත්අඩංගුවට ගන්නවා, හිරේ දානව කියලා දෙමළ ඩයස්පෝරාවයි ඔහේ ඉන්න මන්ත්‍රීලයි වහසි බස් කිව්ව වුනාට අපේ ජනාධිපති තුමා ඒව තඹ දොයිතුවකට ගත්තෙ නැහැ. දැන් කවුරුත් දන්නව අපේ ලොක්කගෙ හැටි. කොටි වනසන්න පුළුවන් නම්, ඔය පෙන්දො ටිකක් කෑ ගැහුවම බය වෙනවද? විකාර."

**කුජදා - TUE** ඒ අතරෙ කොළඹ පාර්ලිමේන්තුවෙදි ජයලත් ජයවර්ධන මන්ත්‍රීවරයට කට්ටියක් එකතුවෙලා ගහලා. ඒත් මේ ඔක්සපර්ෆඩ් කේස් එකටමයි. චෝදනාව ජයලත් ලන්ඩන් ඇවිල්ලා ජනාධිපතිට විරුද්ධව මෙහේ දෙමළ ඩයස්පෝරාව උසිගන්නලා ගියයි කියලා. ජයලත් කියනවා "අනේ මම ලන්ඩන් ගියාට, ඔය කියන දවසේ මං හිටියෙ ඉතාලියෙ, බලන්න බොරු නං පාස්පෝට් එක, ඔය ඩයස්පෝරාකාරයොත් එක්ක මගේ කිසි සම්බන්ධකමක් නැහැ" යි කියලා. මමත් හිතන්නෙ ජයලත් ගෙ සම්බන්ධයක් නැහැ. කිව්වත් නැතත් ගිය මාසෙ ඉඳලා මෙහේ එල්ටීටීඊ කාරයො ලෑස්ති වෙලා හිටියෙ. ජයලත් නෙවෙයි ඔක්ස්ෆර්ඩ් යූනියන් එකෙන් තමයි දෙමළ අයට සේරම විස්තර දන්වලා තියෙන්නෙ.

**බුදදා- WED** කවුරුත් දැන් එක හඬින් කියන කතාවක් තමයි, දැන් ජනාධිපති මන්දිරේ ඇතුළෙ ජනාධිපති වටකර ගෙන උපදේශකයො රැළක් ඉන්න බව. ඒ ගොල්ල තමයි උපදෙස් විතරක් නෙවෙයි, ලණුත් දෙන්නෙ. ඔය හාදයො ටික වටවුණේ යුද්දෙන් පස්සෙ. යුද්දෙ කාලෙ ඔවුන් ටික හිටිය නම් යුද්දෙ දිනන්න හම්බ වෙන්නෙ නෑ. ඔක්ස්ෆර්ඩ් වැඩේටත් සම්පූර්ණ ලණුව දුන්නෙ ඒ කේවට්ටයො රැළ. ජනපතිතුමාට මටදෙන්න පුළුවන් උපදේශය මේකයි. පුළුවන් ඉක්මනට ඔය උපදේශකයො ටික හලන්න. ඒ ගමෙන් ගෙනාපු ගම් බුද්ධිය හොඳටම ඇති රට හදන්න. ගැටවලට අහුවෙන්න එපා. මේ කියන්නෙ හිතවත්කමටයි.

**ගුරුදා - THU** ශ්‍රියානියි පාලිතයි ළමයි දෙන්නයි එංගලන්තෙට ඇවිල්ලා අවුරුදු හතරකට පස්සේ පළමුවෙනි වතාවට ගිය මාසෙ ලංකාවට ගියා. මහරගම ලොකු අම්මලයි ගෙදරලු නැවතුණේ. ඒ ගෙදර මැස්සො දෙන්නෙක් දැකලා ශ්‍රියානි ලොකු අම්මට කෑගහලා ළමයිත් අරං ගිහින් කොළඹ ගලදාරි එකේ නැවතුනාලු. හිඟුරග්ගොඩ ගමට ගියේ නැතිලු මොකද එහේ "වල ටොයිලට්" තියෙන්නෙ කියලා. ලොකු අම්ම කිව්වලු "දුවේ උඹලා ආයිත් මෙහේ එනකොට අර ඇමරිකන්කාරයො හඳට යනකොට ඇඳන් ගිය ජාතියෙ සූට් ඇඳගෙන වරෙල්ලා, එතකොට උඹලට ඔය කරදරේ නෑ නේ" කියලා.

**කිවිදා- FRI** ලන්ඩන්වල මේ ළඟදි කොටි ත්‍රස්තයින්ගෙ මහා වීර දිනය පැවැත්තුවා. ඒකෙ ඉස්සරහින්ම හිටියෙ නව සමසමාජ පක්ෂයෙ වික්‍රමබාහු කරුණාරත්න. මැන් එතන ලොකු කතාවක් කළා. ප්‍රභාකරන් ඇතුළු කොටි නායකයො මැරුණයි කියලා දැනගත්තු වෙලාවෙ වික්‍රමබාහුට දුක වැඩිකමට හෝ ගාලා කඳුළු ගැලුවයි කියලා කිව්වා. මැන් ට ඇත්තට කියන්න තිබුණෙ, මෙහෙමයි. "දුක කොච්චර වැඩිද කියනවනම් ඒ වෙලාවෙ මා ළඟ සයනයිඩ් කරලක් තිබුණ නම් අම්මප මම කනව" කියලා. මේ පාහරයා ඇත්තට මොකට ලංකාවෙ ඉපදුනාද?

**ශනිදා- SAT** ළඟදි පිටරටවල ඉන්න කොටි එකතුවෙලා ලෝක කොටි සංගමය කියලා එකක් හැදුවා. ඒකෙන් ඊළම් ආණ්ඩුවකුත් පිහිටෙව්වා. ඒකෙ අගමැති ඕස්ට්‍රේලියාවෙ ඉන්න කොටියෙක්. මුදල් ඇමති කැනඩාවෙ ඉන්න කොටියෙක්. සෞඛ්‍ය ඇමති නෝර්වේ ඉන්න කොටියෙක්. වෙළඳ ඇමති ප්‍රංශෙ ඉන්න එකෙක්. ඔය ආදි වශයෙන්. හැබැයි ලන්ඩන් ඉන්න එක කොටියෙකුටවත් තනතුරක් දීලා නැහැ. ලන්ඩන් කොටින්ට ඒකට තදවෙලා ලු ඉන්නෙ. "යකෝ අපි මෙහේ හැම්බර්ගර් කකා මාරාන්තික උපවාස කරනවා. තේම්ස් ගඟට පනිනවා. පොලීසිය බයකරන්න ඇඟේ බොරුවට පැට්‍රල් ගාගන ගිනිපෙට්ටිය හොයනවා. ඒත් අපිට ඇමතිකමක් දෙන්නෙ නැද්ද?